SLIM
Sri Lanka Institute of Marketing

2022 නොවැම්බර් 25,

.................................................,

.................................................,

.................................................

**<u>‘Marketing Roks – 2022’ තරඟාවලියට සහභාගී වීම සඳහා ඔබ පාසලට කෙරෙන ආරධනයයි.</u>**

‘Marketing Roks – 2022’ දීප ව්‍යාප්ත තරඟාවලිය සඳහා සහභාගී වන මෙන් ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) ඔබ පාසලට ආරධනා කරනුයේ ඉමහත් සතුටෙනි. මෙම තරඟාවලිය තුළින් සිසුන්ට “අලෙවිකරණය” සම්බන්ධ උත්තේජනයක් ලබාදීම සහ ඔවුන්ගේ සැඟවුණු දක්ෂතා ඔප්නැංවීම සිදුකරමින්, මෙම ව්‍යාපෘතිය දීප ව්‍යාප්ත වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණ මාලාවක් හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහනට සහභාගී වීමෙන් සිසුන්ට වඩාත් කුතුහලය දනවන අලෙවිකරණය පිළිබඳව පාඩම් ඉගෙනීමට මෙන්ම ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම උදෙසා නිරාවරණය කරනු ලබයි. ඊට අමතරව මුල් අවධියකදී ව්‍යාපාර ආයතනයක් දියුණුකොට කළමනාකරණය කිරීමට අත්‍යවශ්‍ය වන නිර්මාණශීලීත්වය ඉගෙනීමට මෙමගින් අවස්ථාව හිමිවනු ඇත.

ශ්‍රී ලාංකේය අලෙවිකරුවන් සඳහා ඇති ඉහළම ආයතනය වන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය 1970 දී ආරම්භ වී පසුව 1980 දී පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාගත කරන ලද අතර එය අලෙවිකරණය සඳහා වන ජාතික ආයතනය සහ ‘‘ලාභ නොලබන’’ ආයතනයක් ලෙස පිළිගෙන ඇත. විවිධ ක්ෂේත්‍රයන්හි නියැලෙන වෘත්තිකයන් සමග එක්ව ශ්‍රී ලංකාවේ අලෙවිකරණ වෘත්තිය නඟාසිටුවීම ගෞරවනීය මට්ටමකින් සිදු කිරීමේ බලය අප හට ඇත.

දී ඇති සැබෑ ව්‍යාපාර සිද්ධි අධ්‍යනයක් (Case Study Analysis) විසඳමින් ඊට ආයතනික විසඳුමක් ඉදිරිපත් කිරීමෙන් සිසුවාට සැබෑ ජීවන තත්වයක් අත්දැකීමට අවස්ථාව ‘Marketing Roks’ අභියෝගය මගින් උදාකර දෙනු ලබයි. විශ්ලේෂණාත්මක බව, නිර්මාණශීලී බව සහ රාමුවෙන් පිටතට සිතීමේ හැකියාව සහභාගී වන තරඟකරුවන්ට අනෙක් අයට වඩා ‘තියුණු’ බවක් ලබා දීමට උපකාරී වන අතර තරුණ පරපුර ආයතනික ලෝකයේ අභියෝගයන්ට මනා විශ්වාසයෙන් සහ කැපවීමෙන් යුතුව මුහුණදීමට නිසැකයෙන්ම සූදානම් කරවීම මෙමගින් සිදුකරනු ලබයි. තම දක්ෂතා විදහා පෑමට සහ ඒවාට ත්‍යාග දිනා ගැනීමට මෙය මහඟු අවස්ථාවකි. තරගයට සහභාගී වන සෑම තරඟකරුවෙකුටම සහභාගීත්වය වෙනුවෙන් වෘත්තීමය වශයෙන් පිළිගත් සහතිකපතක් පිරිනමනු ලබයි. තවද, කලාපීය ජයග්‍රාහකයන්ට කුසලානයක් සහ පිළිගත් වෘත්තීය සහතිකයක් පිරිනමනු ලබයි. කලාපීය ජයග්‍රාහකයන් අවසන් මහා තරඟයට සුදුසුකම් ලබන අතර ඔවුන්ට ද සහභාගීත්වය වෙනුවෙන් වටිනා සහතිකයක් පිරිනැමේ. අවසන් මහා තරඟයේ ජයග්‍රාහකයින්ටද මුදල් ත්‍යාග, කුසලාන සහ සහතික පත්‍ර පිරිනමනු ලබයි.

**‘Marketing Roks’** අභියෝගයේ ක්‍රියාපටිපාටිය පිළිබඳව පහත මාර්ගෝපදේශනයෙන් කරුණු දක්වා ඇත.

- එක් කණ්ඩායමක් සිසුන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. **(ලියාපදිංචිය සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.)**
- එක් පාසලකට උපරිම කණ්ඩායම් පහක් මෙම තරගාවලියට සහභාගිකරවීමේ හැකියාව ඇත. එනම් ඔවුන් XYZ විදුහල – A / B / C / D / E ආකාරයට නම් කරනු ලබයි.
- තරගාවලිය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් සමගාමීව ක්‍රියාත්මක වේ. එමනිසා, පාසලකට ඕනෑම භාෂාවක් යටතේ කණ්ඩායම් ඉදිරිපත් කළ හැකිය.
- එක් පාසලක් කණ්ඩායම් කිහිපයක් සහභාගි කරවන්නේ නම් එම කණ්ඩායම් බහුභාෂා යටතේ සහභාගි කරවීමට එම පාසලට අවස්ථාව ඇත. එනම් XYZ විදුහල - A: සිංහල, XYZ විදුහල - B: දෙමළ, XYZ විදුහල - C : ඉංග්‍රීසි.
- සිද්ධි අධ්‍යනයන් (Case Studies) සියලුම පාසල් වලට භාෂා ත්‍රිත්වයෙන් යවනු ලබයි.
- කලාප තරඟාවලි සඳහා වන අදාළ සීමා නිර්ණයන් පහතින් දක්වා ඇත.

(I) - කලාප - 1 : අනුරාධපුර, පුත්තලම සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල පාසල්

(II) - කලාප - 2 : බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල පාසල්

(III) - කලාප - 3 : මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර, වව්නියාව සහ යාපනය යන දිස්ත්‍රික්කවල පාසල්

(IV) - කලාප - 4 : කොළඹ, ගම්පහ, සහ කළුතර යන දිස්ත්‍රික්කවල පාසල්

(V) - කලාප - 5 : කෑගල්ල, කුරුණෑගල, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල පාසල්

(VI) - කලාප - 6 : ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල පාසල්

(VII) - කලාප - 7 : කිලිනොච්චි, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල පාසල්

(VIII) - කලාප - 8 : රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල්

SLIM
Sri Lanka Institute of Marketing

- ලියාපදිංචි වීම 2022 දෙසැම්බර් 01 සිට 2023 ජනවාරි 15 දක්වා විවෘතයි.
- ලියාපදිංචිය ආකාර දෙකකින් සමන්විතයි.

විද්‍යුත් තැපැල : **mihirinie.f@slim.lk (කලාප - 4)**

**: hilal.m@slim.lk (කලාප – 1/2/3/7/8)**

**: indika.h@slim.lk (කලාප –5)**

**: matara@slim.lk (කලාප - 6)**

**පිටපත්**

**sasik.r@slim.lk**

සාමාන්‍ය තැපැල : **'Marketing Roks' ලියාපදිංචිය, ව්‍යාපාර සංවර්ධන අංශය, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය, අංක. 94, ආනන්ද රාජකරුණා මවත, කොළඹ 10. (කලාප - 4)**

: **සුබෝධ මහතා, 'Marketing Roks' ලියාපදිංචිය, ව්‍යාපාර සංවර්ධන අංශය, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය, අංක. 94, ආනන්ද රාජකරුණා මවත, කොළඹ 10. (කලාප – 1/2/3/7/8)**

**: 'Marketing Roks' ලියාපදිංචිය, SLIM ව්‍යාපාර පාසල මහනුවර,** අංක 524 /1, පේරාදෙනිය පාර , මහනුවර. **(කලාප –5)**

: **ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය, SLIM ව්‍යාපාර පාසල මාතර**, අංක 213, දෙවන මහල, අනගාරික ධර්මපාල මාවත, මාතර. **(කලාප – 6)**

- ලියාපදිංචිය පිලිබඳ වැඩිදුර තොරතුරු දැන ගැනිම සඳහා පහත අංක අමතන්න.

070 370 1166 – මිහිරිනී මහත්මිය **(කලාප – 4)**

070 366 9339 – සුබෝධ මහතා **(කලාප -1/2/3/7/8)**

070 373 2845 – ඉන්දිකා මහත්මිය **(කලාප –5)**

070 322 7949 – ලහිරු මහතා **(කලාප – 6)**

- කණ්ඩායම් ඉදිරිපත් කරවන පාසල් වලට 'අලෙවිකරණ වෘත්තිය සහතික පත්‍ර පාඨමාලාව' (Professional Certificate in Marketing – PCM) මාර්ගගත ක්‍රමයට (Online) හැදෑරීමට වටිනා ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි. සුදුසුකම් ඇති සිසුන් හට එම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ අවස්ථාව එම පාසලට ඇත.
- කලාප තරඟාවලි පවත්වන දිනයන් / කාලයන් / සහ ස්ථානයන් ලියාපදිංචි වූ සියලුම පාසල් වෙත කල්තියා එක් එක් පාසලට දුරකථන ඇමතුමක් ලබාදීම මගින් දැනුම් දෙනු ලබයි.
- කලාප වෙත සිද්ධි අධ්‍යයන සමාලෝචන සැසි (Case Study Briefings) මාර්ගගත ක්‍රමයට 2023 ජනවාරි 16 සිට 2023 ජනවාරි 31 දක්වා සිදු කරනු ලබයි.

- 'Marketing Roks' සම්පූර්ණ අභියෝගයේ කලාප තරඟ මෙන්ම අවසන් මහා තරගය දී ඇති සිද්ධි අධ්‍යනය විශ්ලේෂණය කිරිම සහ ඉදිරිපත් කිරීම මත පමණක් පදනම්ව ක්‍රියාත්මක වේ. ඉදිරිපත් කිරීම් සඳහා එක් කණ්ඩායමකට විනාඩි 30ක කාලයක් ලබා දෙයි. සිද්ධි අධ්‍යනයන් ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම් වලට Power Point Slides / දර්ශන (Videos) / සුදු පුවරු (White Boards) / Flip Charts ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය වන විවිධ මෙවලම් (Props) මෙන්ම අනෙකුත් ගැලපෙන නිර්මාණශිලි ක්‍රමයන්ද, භාවිත කළ හැකිය. සෑම ඉදිරිපත් කිරීමක් ම තුන් දෙනෙකුට නොඅඩු විනිසුරු මඩුල්ලක් විසින් විනිශ්චය කරනු ලබයි.
- කලාපිය තරඟ 2023 පෙබරවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දක්වා පවත්වනු ලබයි.
- අවසන් මහා තරඟය 2023 මාර්තු 10 කොළඹදී පැවැත්වේ.
- අවසන් මහා තරගයේ ජයග්‍රහකයින්ට පහත මුදල් ත්‍යාග පිරිනැමේ.

| ස්ථානය | ත්‍යාගය |
|---|---|
| **පළමු ස්ථානය** | රුපියල්. 100,000.00 |
| **දෙවන ස්ථානය** | රුපියල්. 80,000.00 |
| **තෙවන ස්ථානය** | රුපියල්. 60,000.00 |

තවද, මේ තුලින් සිසුන් ලබාගන්නා අත්දැකීම් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු සටහන් වලට (CV), පෞරුෂත්වයට, මෙන්ම අවසානයේ දී ඔවුන්ගේ ඉදිරි අනාගතයට වටිනාකම් එක් කරනු ලබයි. එබැවින්, මෙම තරඟාවලියට ඔබගේ පාසලෙන් කණ්ඩායමක්/කණ්ඩායම් ඉදිරිපත් කරමින් ඊට සම්පූර්ණ සහයෝගය ලබාදෙනු ඇතැයි අප බලාපොරොත්තු වන්නෙමු.

ස්තුතියි,

මෙයට විශ්වාසී,



**ආචාර්ය දිල්හාන් සම්පත් ජයතිලක**

ව්‍යාපෘති සභාපති *: 'Marketing Roks - 2022'*

*විධායක කමිටු සාමාජික : ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය – 2022 / 2023*